# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01. இலங்கை | The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: PE/COP/POLI/Circulars
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 25.05.2015


රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01


රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 1/2015

සියළුම අමාත්‍යාංශ ලේකම්වරු,
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රජය සතු සමාගම්වල සභාපතිවරු

<u>රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රජය සතු සමාගම්වල නිලධාරීන් සඳහා ප්‍රවාහන පහසුකම්</u>

1. නිල වාහන හිමිකාරිත්වය, නිල වාහන හිමි නිලධාරීන් සඳහා මාසික ඉන්ධන සීමාව, රාජ්‍ය ව්‍යවසායන්හි නිල වාහන හිමිකම් ඇති නිලධාරීන්ට නිල වාහන සැපයීම වෙනුවට මාසික ප්‍රවාහන දීමනා ගෙවීම සහ නිල වාහන හිමිකම් නොමැති මධ්‍යම මට්ටමේ කළමනාකරුවන් සඳහා කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් සැපයීම පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ.

2. නිල වාහන හිමිකාරිත්වය

   පහත සඳහන් නිලධාරීන් රාජකාරී හා පුද්ගලික පාවිච්චිය සඳහා නිල වාහනයක් ලැබීමට සුදුසුකම් ලබයි.

   2.1 සභාපති/ නිසි බලධාරී

   2.2 ප්‍රධාන විධායක නිලධාරී/ කළමනාකාර අධ්‍යක්ෂ/ විධායක අධ්‍යක්ෂ/අධ්‍යක්ෂ ජනරාල්

   2.3 ප්‍රධාන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන මෙහෙයුම් නිලධාරී සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද සහ එම දෙපාර්තමේන්තුව 2006 වසරේ නිකුත් කරන ලද චක්‍රලේඛ අංක MSD 30 ප්‍රකාරව HM 1-1 ශ්‍රේණියේ හෝ ඊට ඉහළ මට්ටමේ තනතුරක් දරණ වෙනත් ඕනෑම නිලධාරියෙකු

3. නිල වාහන හිමි නිලධාරීන් සඳහා ඉන්ධන දීමනා සීමාවන්

3.1 නිල වාහන හිමි නිලධාරීන් හා ඔවුන්ට අදාල ඉන්ධන දීමනා පහත පරිදි වේ.

| නිල වාහනයක් අනුයුක්ත කිරීමට සුදුසුකම් ලබන නිලධාරී කාණ්ඩයන් | මාසික ඉන්ධන සීමාව (ලීටර්) | අනුමත මාසික ඉන්ධන දීමනාව |
|---|---|---|
| 1. සභාපති/ නිසි බලධාරී | 170 | අනුමත මාසික ඉන්ධන සීමාව (ලීටර්) × අදාල මාසයේ පළමු දින පැවති ඉන්ධන ලීටරයක මිල |
| 2. කළමනාකරණ අධ්‍යක්ෂ/ විධායක අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී/අධ්‍යක්ෂ ජනරාල් | 150 | |
| 3. ප්‍රධාන මෙහෙයුම් නිලධාරී/ ප්‍රධාන මූල්‍ය නිලධාරී | 140 | |
| 4. 2006 වසරේ නිකුත් කරන ලද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක MSD 30 ප්‍රකාරව HM1-1 ශ්‍රේණියේ හෝ ඊට ඉහළ එම දෙපාර්තමේන්තුවෙන් අනුමත කරන ලද තනතුරක් දරන වෙනත් ඕනෑම නිලධාරියෙක් | 120 | |

3.2 රාජකාරී කටයුතු ඉටු කිරීම සඳහා මාසික ඉන්ධන දීමනාව ප්‍රමාණවත් නොවන විශේෂ අවස්ථාවන්හිදී, පහත සඳහන් පරිදි අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව, දරන ලද සත්‍ය ඉන්ධන වියදම් ප්‍රතිපූර්ණය කළ හැක.

3.2.1 සභාපති හෝ නිසි බලධාරී - අධ්‍යක්ෂ මණ්ඩලයේ නිර්දේශ සහිතව අදාල රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය

3.2.2 විධායක අධ්‍යක්ෂවරු හා අනෙකුත් නිලධාරීන් - අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය

3.3 නිල වාහනයක් හිමි නිලධාරියෙකු හට එම නිල වාහනය පාවිච්චි කිරීම හෝ නිල වාහනය වෙනුවට රු. 30,000 ක මාසික ප්‍රවාහන දීමනාවක් සහ අදාල අනතුරට හිමි මාසික ඉන්ධන දීමනාව ලබාගැනීම යන විකල්ප දෙකෙන් එකක් තෝරා ගත හැක. කෙසේ වුවද, ප්‍රවාහන දීමනාව ලබා ගන්නා නිලධාරීන් හට රියදුරෙකු හෝ රියදුරු දීමනාවක් ලබා දිය නොහැක.

3.4 ප්‍රවාහන දීමනාව හා ඉන්ධන දීමනාව මාසික වැටුපට එක්කර ගෙවීම් සිදු කල හැක.

3.5 නිල වාහනයක් වෙන් කර ඇති නිලධාරීන් සහ ප්‍රවාහන දීමනාව ලබා ගන්නා නිලධාරීන්ට සංචිත වාහන හෝ වෙනත් කාර්යාලීය වාහනයක් භාවිතා කිරීමට හිමිකම් නොමැත.

3.6 සේවා ස්ථානයේ සිට කිලෝ මීටර් 40 ට වඩා දුර විශේෂ රාජකාරී කටයුතු සඳහා කණ්ඩායම් වශයෙන් සහභාගී වීමට කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් සලසා දිය හැක.

3.7 යම් නිලධාරියෙක් එක් තනතුරකට වඩා හොබවන අවස්ථාවක එවැනි නිලධාරියෙක් ඔහුගේ / ඇයගේ ස්ථිර තනතුරට අයත් ඉන්ධන දීමනාව සඳහා පමණක් හිමිකම් ලබයි. කෙසේ වෙතත් අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය යටතේ රාජකාරී අවශ්‍යතා සඳහා වැඩ බලන තනතුරට හිමි උපරිම සීමාව දක්වා අතිරේක ඉන්ධන ලබා ගැනීමට හැකියාව ඇත.

3.8 නිල වාහන හිමි නිලධාරීන්ගේ පුද්ගලික ගමන් සඳහා රියදුරන්ට ගෙවන අතිකාල හා අනෙකුත් ඒකාබද්ධ දීමනා අදාල නිල වාහනය හිමි නිලධාරියා විසින් දැරිය යුතුය.

3.9 මාසයකට වැඩි කාලයක් දේශීය හෝ විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා සිටින නිලධාරියෙකුට අධ්‍යක්ෂ මණ්ඩලයේ විශේෂ අනුමැතියෙන් තොරව ප්‍රවාහන දීමනාව ලබා ගැනීම, නිල

වාහනය පාවිච්චි කිරීම හෝ රියදුරාගේ සේවය ලබා ගැනීමට හිමිකමක් නොමැත. කෙසේ වුවද, නිලධාරියාගේ පාලනයෙන් බාහිර දිගු කාලීන රෝගී තත්ත්වයන් ආදී හේතූන් මත මසකට වැඩි කාලයක් වැටුප් රහිත නිවාඩු ලබා ගෙන සිටින නිලධාරියෙකුට මෙම පහසුකම් ලබා ගැනීමට ඉඩ දිය හැක.

**4 සංචිත වාහන / කණ්ඩායම් ප්‍රවාහනය**

4.1 සංචිත වාහන පාලනය කිරීම හා නඩත්තු කිරීම සඳහා ප්‍රමාණවත් පද්ධති පාලනයන් හා ක්‍රමවේදයන් පවතින බවට ඉහළ කළමනාකාරීත්වය වගබලා ගත යුතු අතර පිරිවැය පිළිබඳවද සැලකිලිමත් විය යුතුය.

4.2 ආයතනය මඟින් සපයනු ලබන කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් කාර්යාල ස්ථානයේ සිට යාමට සහ ඒමට කිලෝමීටර් 100 ක උපරිම දුරකට සීමා වේ.

**5 පෙර නිකුත් කළ මාර්ගෝපදේශයන් හා චක්‍රලේඛ අවලංගු කිරීම.**

2008 ජූලි මස 28 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 50 හා 2003 ජූනි 2 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 12 සමඟ නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යවසායන්හි යහපාලනය සඳහා වන මාර්ගෝපදේශ අත්පොතෙහි අංක 8.3.5 දරණ වගන්තිය මේ සමඟ අවලංගු කරන අතර ඒ වෙනුවට 2015 ජූනි 01 දින සිට බලපැවැත්වෙන පරිදි රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2015 නිකුත් කෙරේ.

**6 මෙම චක්‍රලේඛය පිළිබඳ පැහැදිලි කිරීම්**

මෙම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳව ප්‍රධාන මෙහෙයුම් නිලධාරී විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කළ යුතුය. චක්‍රලේඛයේ විධි විධාන පිළිබඳ යම් පැහැදිලි කිරීමක් අවශ්‍ය නම් දුරකථන අංක 2484623 මඟින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ජේ.එම්.යූ.පී. ජයමහ මහතා හෝ දුරකථන අංක 2484628 මඟින් එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ එම්.ආර්.වී.ආර්. මීපුර මහතාගෙන් ලබා ගත හැක.

අත්/කලේ:- ආර්.එච්.එස්. සමරතුංග
භාණ්ඩාගාරයේ ලේකම්

පිටපත් :

1. ජනාධිපති ලේකම්
2. ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය
3. විගණකාධිපති